## 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම

(Recovery Plan for Learning Loss – 2022)

(10 ශ්‍රේණියේ පළමු වාරයේ කාලච්ඡේද 13 ක් ද දෙවන හා තෙවන වාර වල කාලච්ඡේද 18 ක් ද බැගින් කාලච්ඡේද 49ක් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාමට මෙම සැලැස්ම සකස් කර ඇත.)

# නර්තනය

## 10 ශ්‍රේණිය

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
www.nie.lk

| දෙවන වාරය | | | | | |
|---|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | අත්‍යාවශ්‍ය ඉගෙනුම් ඵල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | කාලච්ඡේද |
| 2.0<br>නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.3.<br>නිවැරදි අංගහාර අනුගමනය කරමින් සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි. | • අදාල තිත් රූපය අනුව සැවුලා/ නාතිලිංචිතාලය/ මණ්ඩූක වන්නම්වල තානම් හා කවි නියමිත නාදමාලා අනුව ගායනව කරයි.<br>• තානම හා කවි ගයමින් පද නර්තනය කරයි.<br>• කස්තිරම/ ඉරට්ටිය/ කලාසම, සීරුමාරුව, අඩව්ව නර්තනයේ යෙදෙයි.<br>• වාදනයට අනුව සම්පූර්ණ වන්නම නර්තනය කරයි. | • වන්නම් නර්තනය (සැවුලා/ නාතිලිංචිතාලය/ මණ්ඩූක වන්නම)සම්පූර්ණයෙන් නැටීම. | 2.3.1<br>වන්නම් නර්තනය කරමු. | 02 |
| 2.0<br>නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.4.<br>ප්‍රස්තාරකරණයේ විධි ක්‍රම අනුගමනය කරයි. | • නියමිත කවි ගායන සහ නර්තන පද ප්‍රස්තාර කිරීමේ විධික්‍රම සාකච්ඡා කරයි.<br>• විධික්‍රම හා විවිධ ශිල්පක්‍රම භාවිත කරමින් අදාළ කවි හා නර්තන පද කොටස් ප්‍රස්තාර කරයි.<br>• නිවැරදිව ප්‍රස්තාරකරණයේ යෙදෙමින් තාල පිළිබඳ ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.<br>• තුන් තිතේ ප්‍රභේද හඳුන්වයි. | • බෙර පද හා කවි පද ප්‍රස්තාරය (වන්නම්, රබන් හා චාමර කවි) | 2.4.1<br>බෙර පද හා කවි ප්‍රස්තාර කරමු. | 03 |
| 5.0<br>ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය | 5.3.<br>ශ්‍රී ලාංකේය ගැමි නාටක හා සබැඳි පසුබිම අධ්‍යයනය කර සුවිශේෂ ලක්ෂණ ඉදිරිපත් කරයි. | • සොකරි දේශීය ගැමි නාටකයක් බව ප්‍රකාශ කරයි.<br>• සොකරි නාටකය ප්‍රචලිත ප්‍රදේශ හා පැවැත්වීමේ අරමුණු විස්තර කරයි.<br>• සොකරි කථා ප්‍රවෘත්තිය හා චරිත නිරූපණ පිළිබඳ විචාරාත්මකව අදහස් දක්වයි. | • සොකරි ගැමි නාටකය<br>• කතා පුවත, චාරිත්‍ර, ගායන, වාදන, නර්තන සහ රංගවස්ත්‍රාභරණ | 5.3.1<br>සොකරි ගැමි නාටකය පිළිබඳව තතු විමසා බලමු. | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි. | | • ගැමි නාටක අභාවයට යා නොදී ආරක්ෂා කරගැනීමට යෝජනා ඉදිරිපත් කරයි | | | |
| 6.0<br>රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සුවිශේෂී ලක්ෂණ විචාරයට ලක් කරයි. | 6.2.<br>ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍ය නරඹා විචාරයට ලක් කරයි. | • මුද්‍රා නාට්‍යයට පාදක වූ කතා පුවත විස්තර කරයි.<br>• කතා පුවතින් විද්‍යමාන ජීවන දැක්ම විස්තර කරයි.<br>• චරිත විකාශය සඳහා නර්තන යොදාගෙන ඇති ආකාරය පිළිබඳඅදහස් දක්වයි.<br>• කලාත්මක ලක්ෂණ තීව්‍ර කිරීම සඳහා සංගීතය, රංග වස්ත්‍රාභරණ, වේදිකා සැරසිලි, ආලෝකකරණය ආදිය යොදාගෙන ඇති ආකාරය විචාරාත්මක ව ඇගයීමට ලක් කරයි. | • කරදිය/ කුඹී කතාව මුද්‍රා නාට්‍ය තේමාව, චරිත, රංගවස්ත්‍රාභරණ, නර්තනය, සංගීතය හා පසුතල නිර්මාණ | 6.2.1<br>කලා කෘතියක රස මිහිර පවසමු. | 03 |
| 4.0<br>ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායන වල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 4.2.<br>නියමිත නාදමාලාව අනුගමනය කරමින් ජන ගායන ඉදිරිපත් කරයි. | • රබන්, ඔංචිලි වාරම්, චාමර කවි නිවැරදි නාදමාලා අනුව තාල තබමින් ගායනය කරයි.<br>• බෙර වාදනයට අනුව තාල තබමින් රබන්, ඔංචිලි වාරම්, චාමර කවි ගායනය කරයි.<br>• ඒකීය හඬතලය හා ස්වකීය හඬ තලය හඳුනාගෙන කවි ගායනය කරයි. | • රබන්, ඔංචිලි වාරම් හා චාමර කවි | 4.2.3<br>රබන්, ඔංචිලි වාරම් හා චාමර කවි ගයමු. | 02 |
| 3.0<br>සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනා ගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 3.2<br>සන්නිවේදන කාර්යය සඳහා වාද්‍ය භාණ්ඩ භාවිත කරන අවස්ථා විස්තර කරයි. | • සන්නිවේදන කාර්යය සඳහා අතීතයේ සිටම දේශීය වාද්‍ය භාණ්ඩ භාවිත කළ බව ප්‍රකාශ කරයි.<br>• සන්නිවේදන අවස්ථා ආගමික හා සාමාජයීය වශයෙන් වර්ග කර දක්වයි. | • අණ බෙර<br>• රණ බෙර<br>• මළ බෙර<br>• වද බෙර<br>• හේවිසි වාදනය | 3.2.1<br>සන්නිවේදන කාර්යය සඳහා වාද්‍ය භාණ්ඩ යොදා ගැනීම පිළිබඳ තොරතුරු උගනිමු. | 03 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | • වර්තමානයේ විවිධ සමාජ අවස්ථා වලදී වාද්‍ය භාණ්ඩ භාවිතයේ දී විවිධ උපක්‍රම යොදා ගන්නා බවට කරුණු ඉදිරිපත් කරයි. | | | |
| 7.0<br>අත්දැකීම් ඇසුරු කරමින් විවිධ කලාංග නිර්මාණය කරයි. | 7.1<br>නාට්‍ය ගීතයකට නර්තන නිර්මාණය කරයි. | • තෝරාගත් ගීතය පිළිබඳ සාකච්ඡා කරයි.<br>• නිවැරදි නාද රටා අනුව ගීතය ගායනය කරයි.<br>• ගීතයට උචිත චලන යොදා ගනිමින් නර්තන නිර්මාණය කරයි.<br>• කණ්ඩායමක් ලෙස සාමූහිකව නර්තනය ඉදිරිපත් කරයි.<br>• අන්‍යයන්ගේ අදහස් වලට ගරු කරයි. | • මෙම ගිම්හාන ගීතය හෝ හනික වරෙව් කොල්ලනේ ගීතයට නර්තන නිර්මාණය<br>• අදාළ චලන භාවිතය<br>• අවකාශය භාවිත කිරීම | 7.1.1<br>වේදිකා නාට්‍ය ගීයට නර්තන නිර්මාණය කරමු. | 03 |
| **දෙවන වාරය කාලච්ඡේද එකතුව** | | | | | 18 |